ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
කළමනාකරණ අධ්‍යයන උපාධි පාඨමාලාව
තුන්වන මට්ටම
අවසාන පරීක්ෂණය 2018
මූල්‍ය හා පිරිවැය ගිණුම්කරණය -MCU 1206
කාලය : පැය තුන (03) යි

ප්‍රශ්න ගණන : 05
පිටු ගණන : 08

දිනය: 2018.11.03 මුළු ලකුණු : 100 වේලාව:ප.ව.01.30 - ප.ව.04.30

වැදගත් උපදෙස් :

- පළමු (01) ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න හතරකට (04) පමණක් පිළිතුරු සපයන්න.
- සියළුම පෙරවැඩ පෙන්වන්න.
- වැඩසටහන් සම්පාදනය කල නොහැකි ගණක යන්ත්‍ර භාවිතා කළ හැක.

ප්‍රශ්න අංක 01 (අනිවාර්ය ප්‍රශ්නය)
පහත සඳහන් වන්නේ ගැලැක්සි පුද්ගලික සමාගමේ 2018.03.31 දිනට උපුටා ගන්නා ලද ශේෂ පිරික්සුමයි.

(රු.'000)

| | හර | බැර |
|---|---|---|
| ප්‍රකාශිත ප්‍රාග්ධනය (1,000,000 ක සාමාන්‍ය කොටස්) | | 35,000 |
| 2017 අප්‍රේල් 01 දිනට රඳවාගත් ඉපැයුම් | | 15,600 |
| පොදු සංචිතය | | 7,500 |
| 10% ණයකර | | 8,000 |
| දේපල පිරියත හා උපකරණ - පිරිවැයට | | |
| ඉඩම් | 43,000 | |
| ගොඩනැගිලි | 20,500 | |
| මෝටර් රථ | 4,500 | |
| 2017 අප්‍රේල් 01 දිනට සමුච්චිත ක්ෂය | | |
| ගොඩනැගිලි | | 3,700 |
| මෝටර් රථ | | 2,000 |
| 2016/2017 ආදායම් බදු වෙන්කිරීම | | 50 |
| 2018 මාර්තු 31 දිනට තොගය | 6,200 | |
| වෙළඳාමෙන් ලැබිය යුතු දෑ / වෙළඳාමෙන් ගෙවිය යුතු දෑ | 5,650 | 1,880 |
| බැංකුවේ ඇති මුදල් | 950 | |
| විකුණුම් | | 25,000 |
| විකුණුම් පිරිවැය | 10,700 | |
| පරිපාලන වියදම් | 3,920 | |
| බෙදාහැරීමේ වියදම් | 2,800 | |
| ණයකර මත පොලිය | 400 | |
| ආදායම් බදු ගෙවීම | 110 | |
| එකතුව | 98,730 | 98,730 |

පහත සඳහන් අමතර තොරතුරු ඔබට සපයා ඇත.

1) දේපල පිරියත උපකරණ සරළ මාර්ග ක්‍රමයට ක්ෂය කළ යුතුය.
   අදාල වත්කම්වල ඵලදායි ජීවකාලයන් පහත පරිදි ඇස්තමේන්තු කොට ඇත.
   - ගොඩනැගිලි : වසර 20
   - මෝටර් රථ : වසර 05

2) 2018 මාර්තු 31 වන දිනට පහත දෑ ගැලපිය යුතුය.

| | රු. |
|---|---|
| ඉදිරියට දැරූ කුලී වියදම් | 25,000 |
| උපචිත විදුලි වියදම් | 8,000 |

3) ආදායම් බදු පිළිබඳ විස්තර පහත පරිදි වේ.
   - 2017/2018 තක්සේරු වර්ෂය සඳහා ආදායම් බදු වගකීම රු. 250,000/- ක් ලෙස ඇස්තමේන්තු කොට පොත්වලට වාර්තා කළ යුතුය.
   - ගිණුම් වර්ෂය තුල දරන ලද ආදායම් බදු ගෙවීම් ආදායම් බදු ගෙවීමේ ගිණුමට හර කොට ඇත.
   - 2016/2017 තක්සේරු වර්ෂය සඳහා රු.50,000/- ක ආදායම් බදු ප්‍රතිපාදනයක් සිදු කොට ඇත. එය මෙම වසරේදී ගැලපිය යුතුය.

4) 2018 මාර්තු 31 වන දිනට ලැබිය යුතුව තිබූ වෙළඳ ණයගැතියන්ගෙන්, පෙරේරා මහතාගෙන් අයවිය යුතු රු.50,000/- ක මුදලක් බොල්ණය ලෙස කපා හැරීමට තීරණය කර ඇත. වසර අවසානයේ අඩමාන ණය වෙන්කිරීම ඉතිරි ණයගැතියන්ගෙන් 5% ක් විය යුතුය.

5) 2015.04.01 දින රු.1,000,000/- කට මිලදී ගෙන තිබූ මෝර් රථයක්, 2017.09.30 වන දින රු.9,000,000/- කට විකුණන ලදී. විකිණීමෙන් ලද චෙක්පත බැංකු පොතට නිවැරදිව වාර්තා කොට රඳවාගත් ලාභ ගිණුමට බැර කොට තිබේ. මේ පිළිබඳව වෙනත් කිසිදු සටහනක් තබා නොමැත.

6) 2017 අප්‍රේල් 10 වන දින, අධ්‍යක්ෂක මණ්ඩලය විසින්, 2017 වර්ෂයේ ලාභවලින් සාමාන්‍ය කොටසකට රු.5/- බැගින් ලාභාංශයක් ගෙවිය යුතු බවට තීරණය කොට තිබේ.

7) 2017 මැයි 05 වන දින අධ්‍යක්ෂක මණ්ඩලය විසින් මූල්‍ය වාර්තා අනුමත කොට තිබේ.

ඔබ විසින්,
ප්‍රසිද්ධ කිරීමේ ආකෘතියට ගැලැක්සි පුද්ගලික සමාගමේ

I 2018 මාර්තු 31 වන දිනෙන් අවසන් වර්ෂය සඳහා විස්තීරණ ආදායම් ප්‍රකාශනය පිළියෙල කරන්න.

II 2018 මාර්තු 31 වන දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය පිළියෙල කරන්න.

(මුළු ලකුණු 40)

ප්‍රශ්න අංක 02

අමල්, බිමල් සහ සිරිමල් හවුල් ව්‍යාපාරයක හවුල් කරුවන් වූ අතර ඔවුන් පිලිවෙලින් 2:2:1 යන අනුපාතයට ලාභ අලාභ බෙදා ගැනීමට එකගව කටයුතු කලහ.
හවුල් ගිවිසුමේ පහත සඳහන් කොන්දේසි ඇතුලත් වේ.

- හවුල් කරුවන් වර්ෂය ආරම්භයේ පැවැති ප්‍රාග්ධන ගිණුමේ ශේෂ මත 10%ක වාර්ෂික පොළියකට හිමිකම් කියනු ලැබේ.
- අමල් සහ බිමල් වාර්ෂිකව රු.60,000/- ක සහ රු.36,000/-ක වේතනයකට හිමිකම් කියයි.
- 2017 අප්‍රේල් 01වනට දිනට ප්‍රාග්ධන සහ ජංගම ගිණුම්වල ශේෂ පහත පරිදි වේ.

| | හර (රු.'000) | බැර (රු.'000) |
|---|---|---|
| හවුල් කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම් | | |
| අමල් | | 4,000,000 |
| බිමල් | | 2,400,000 |
| සිරිමල් | | 1,800,000 |
| හවුල් කරුවන්ගේ ජංගම ගිණුම් | | |
| අමල් | | 230,000 |
| බිමල් | | 160,000 |
| සිරිමල් | 50,000 | |
| හවුල් කරුවන්ගේ වාර්ෂික ගැනිලි | | |
| අමල් | 75,000 | |
| බිමල් | 43,200 | |
| සිරිමල් | 90,000 | |

පහත සඳහන් අතිරේක විස්තර ඔබට සපයා ඇත.
2018.03.31 වන දිනට පහත ගැළපුම් සිදු කළ යුතුය.

1) 2018 මාර්තු 31 වන දින සිරිමල් හවුල් ව්‍යාපාරයෙන් විශ්‍රාම ගැනීමට තීරණය කරන ලදී. අනතුරුව ඉතිරි හවුල් කරුවන් පහත කොන්දේසි වලට එකඟ වන ලදී.
   - ලාභ අලාභ සම සමව බෙදා ගත යුතුය
   - ප්‍රාග්ධන මත පොළිය සහ බිමල්ගේ වේතනය පෙර ගිවිසුම පරිදිම වෙනසක් නොකර ලබා දිය යුතුය.
   - කීර්තිනාමය රු.1,000,000/- කට තක්සේරු කොට හවුල් කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම තුලින් ගැළපිය යුතු අතර කීර්තිනාම ගිණුමක් පොත්වල පවත්වගෙන නොයා යුතුය.

2) 2018 මාර්තු 31වන දිනට ජංගම නොවන වත්කම් ප්‍රත්‍යාගණනය කරන ලදී. අදාල තොරතුරු පහත පරිදි වේ.

| | 2018.03.31 දිනට ප්‍රත්‍යාගණිත වටිනාකම | පිරිවැය (රු.) | 2018.03.31 දිනට සමුච්චිත ක්ෂය |
|---|---|---|---|
| ඉඩම් | 3,200,000 | 3,000,000 | - |

| | | | |
|---|---|---|---|
| ගොඩනැගිලි | 4,250,000 | 4,500,000 | 1,000,000 |
| යන්ත්‍ර | 1,000,000 | 2,500,000 | 1,250,000 |

3) ජංගම නොවන වත්කම් හවුල් ව්‍යාපාරයේ ගිණුම් වල ප්‍රත්‍යාගණිත අගයට වාර්තා කොට පවත්වගෙන යා යුතුය.
4) විශ්‍රාම යන හවුල් කරුට අදාල ගෙවිය යුතු මුළු වටිනාකම හවුල් ව්‍යාපාරයට දුන් ණයක් ලෙස පවත්වගෙන යා යුතුය.
5) 2018 මාර්තු 31 වන දිනෙන් අවසන් වර්ෂය සඳහා (විසර්ජනයට පෙර) හවුල් ව්‍යාපාරයේ ලාභය රු. 2,900,000/-
6) මාසිකව කරන ලද ගැනිලි පහත පරිදි වේ. ගැනිලි මත 12%ක වාර්ෂික පොළියක් අය කල යුතුය.
7)

| | |
|---|---|
| අමල් | Rs.6,250 සෑම මසකම ආරම්භයේ |
| බිමල් | Rs.3,600 සෑම මසකම මැද දිනයේ |
| සිරිමල් | Rs.7,500 සෑම මසකම අවසානයේ |

ඉහත තොරතුරු භාවිතා කර, ඔබ විසින් 2018 මාර්තු 31 වන දිනට පහත දෑ පිළියෙල කරන්න.

I. හවුල් කරුවන්ගේ ජංගම ගිණුම්
II. හවුල් කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම්
III. සිරිමල් ගේ ණය ගිණුම

(මුළු ලකුණු 20)

ප්‍රශ්න අංක 03

පහත සඳහන් තොරතුරු සෙනෙවිරත්න ට්‍රේඩර්ස් නම් තනි පුද්ගල ව්‍යාපාරයක පොත් වලින් උපුටා ගන්නා ලදි.

I. ව්‍යාපාරයේ වත්කම් සහ වගකීම් පහත පරිදි වේ.

රු.'000

| | 2017 අප්‍රේල් 01 | 2018 මාර්තු 31 |
|---|---|---|
| ඉඩම් සහ ගොඩනැගිලි (ලියා හල අගයට) | 5,000 | 4,800 |
| මෝටර් රථ (ලියා හල අගයට) | 7,000 | 7,400 |
| 10% ස්ථිර තැන්පත් | 1,000 | 1,000 |
| තොග | 2,500 | 2,400 |
| වෙළඳ ණයගැතියන් ලැබිය යුතු දෑ | 2,800 | 2,700 |
| බැංකුවේ ඇති මුදල් | 1,300 | ? |
| වෙළඳ ණයහිමියන්ට ගෙවිය යුතු දෑ | 1,600 | 1,350 |
| උපචිත විදුලිය | 220 | 170 |

II. සෙනෙවිරත්න මහතා තමගේ ව්‍යාපාරය වෙනුවෙන් ක්‍රමවත්ව ගිණුම් පොත් පවත්වාගෙන ගොස් නොමැත. ඔහු 2017 අප්‍රේල් සිට 2018 මාර්තු දක්වා තම ව්‍යාපාරයේ බැංකු ප්‍රකාශන විශ්ලේෂණය කොට පහත පරිදි තොරතුරු සාරාංශ කොට තිබේ.

| | රු.'000 | | රු.'000 |
|---|---|---|---|
| තැන්පතු: | | චෙක්පත් වලින් කරන ලද ගෙවීම්.... | |
| අත්පිට මුදලට කරන ලද විකුණුම් | 3,500 | අධ්‍යක්ෂකවරුන්ගේ දීමනා | 280 |
| වෙළඳ ණය ගැතියන්ගෙන් ලද ලැබීම් | 2,500 | වේතන | 760 |
| ණය මුදලක් ලැබීම් | 1,000 | විදුලිය | 220 |
| චෙක්පත් වලින් කරන ලද ගෙවීම්: | | ජලය | 272 |
| අත්පිට මුදලට ගැණුම් | 1,250 | රක්ෂණය | 150 |
| වෙළඳ ණයහිමියන්ට කළ ගෙවීම් | 1,500 | බොල් ණය | 28 |
| 2018 මාර්තු 31 වන දින මිලදී ගත් මෝටර් රථය | 1,000 | අලෙවිකරණ වියදම් | 300 |

III. සෙනෙවිරත්න මහතා විසින් ව්‍යාපාරයෙන් ලද සියලුම මුදල් ලැබීම් බැංකු ගත කොට ඇති අතර මුදලට කරන ලද විකුණුම් වලින් සෑම මසකටම රු.25,000/- තම පෞද්ගලික පරිභෝජනයට ගෙන තිබේ.

IV. 2017 ජුලි මස 01 වන දින සෙනෙවිරත්න මහතා රු.1,000,000/-ක බැංකු ණයක් 15%ක පොළියකට ලබා ගෙන තිබේ. මෙම ණය මුදල සඳහා පොළිය මාසිකව ගෙවිය යුතුය. නමුත් 2018 මාර්තු 31 වන දිනෙන් අවසන් වර්ෂය සඳහා කිසිදු පොළී ගෙවීමක් සිදු කොට නොමැත. මෙම ණය සඳහා වාරික ගෙවීම ආරම්භ වන්නට නියමිතව ඇත්තේ 2018 අප්‍රේල් 01 වන දින සිටය.

V. අඩමාණ ණය සඳහා වෙන් කිරීම 2018.03.31 වන දිනට ණය ගැතියන්ගෙන් 10%ක් විය යුතුය.

ඔබ විසින්:

a. 2018 මාර්තු 31 වන දිනට සෙනෙවිරත්න ට්‍රේඩර්ස්හි ශේෂ පිරික්සුම පිළියෙල කරන්න (ලකුණු10)

b. 2018 මාර්තු 31 වන දිනට සෙනෙවිරත්න ට්‍රේඩර්ස්හි මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය ද පිළියෙල කරන්න. (ලකුණු10)

(මුළු ලකුණු 20)

ප්‍රශ්න අංක 04

I. සන්ෂයින් මොබයිල් ලිමිටඩ් හි 2017/2018 ගිණුම් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශනය සහ 2017.03.31 සහ 2018.03.31 දින වලට මූල්‍ය තත්ත්ව ප්‍රකාශන පහත දැක්වේ.

2018 මාර්තු 31 වන දිනෙන් අවසන් වර්ෂය ආදායම් ප්‍රකාශනය (රු.'000)

| | 2017/2018 | |
|---|---|---|
| විකුණුම් | | 217,500 |
| විකුණුම් පිරිවැය | | (165,000) |
| දළ ලාභය | | 52,500 |
| වෙනත් ආදායම් | | 3,000 |
| | | 55,500 |
| බෙදා හැරීමේ වියදම් | 6,375 | |
| පරිපාලන වියදම් | 21,000 | |

| | | |
|---|---|---|
| වෙනත් වියදම් | 3,225 | |
| මූල්‍ය වියදම් | 1,000 | (31,600) |
| බදු පෙර ලාභය | | 23,900 |
| බදුය | | (8,900) |
| බදු පසු ලාභය (කාලපරිච්ඡේදයේ සඳහා ලාභය) | | 15,000 |

2018 මාර්තු 31 වන දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය (රු.'000)

| | 31.03.2018 | | 31.03.2017 | |
|---|---|---|---|---|
| වත්කම් | | | | |
| ජංගම නොවන වත්කම් | | | | |
| දේපළ පිරියත හා උපකරණ | | 134,700 | | 135,000 |
| ජංගම වත්කම් | | | | |
| තොග | 8,700 | | 9,300 | |
| වෙළඳ ලැබිය යුතු දෑ | 13,350 | | 15,750 | |
| වෙනත් ජංගම වත්කම් | 2,700 | | 4,500 | |
| මුදල් සහ මුදල් වලට සමාන දෑ | 1,950 | 26,700 | 4,200 | 33,750 |
| මුළු වත්කම් | | 161,400 | | 168,750 |
| හිමිකම් සහ වගකීම් | | | | |
| හිමිකම් | | | | |
| ප්‍රාග්ධනය සහ සංචිත | | | | |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය - (රු.10 කොටස් බැගින් නිකුත් කොට ඇත) | | 94,800 | | 92,100 |
| සංචිත | 9,000 | | 7,000 | |
| රඳවාගත් සංචිත | 35,950 | 44,950 | 24,400 | 31,400 |
| මුළු හිමිකම් | | 139,750 | | 123,500 |
| වගකීම් | | | | |
| ජංගම නොවන වගකීම් | | | | |
| 15% බැංකු ණය - මහජන බැංකුව | | 9,500 | | 22,000 |
| ජංගම වගකීම් | | | | |
| වෙළඳ ගෙවිය යුතු දෑ | 9,375 | | 18,445 | |
| ගෙවිය යුතු බදු | 2,775 | 12,150 | 4,805 | 23,250 |
| | | | | |
| මුළු හිමිකම් සහ වගකීම් | | 161,400 | | 168,750 |

පහත අතිරේක තොරතුරු ඔබට සපයා ඇත.

a. විකුණුම් වලින් 80% ක් සහ ගැනුම් 15% ණයට පදනමට සිදු කොට තිබේ.

b. 2017.04.01 දිනට ජංගම වත්කම්
   - තොග රු.8,700,000
   - වෙළඳ ණය ගැතියෝ රු.12,100,000

c. 2017.04.01 දිනට ජංගම වගකීම්
   - වෙළඳ ණය හිමින්ට ගෙවිය යතු දෑ රු.8,555,000

ඔබ විසින් 2017/2018 ගිණුම් වර්ෂය සඳහා පහත අනුපාත ගණනය කරන්න.

| | | | |
|---|---|---|---|
| i | දළ ලාභ අනුපාතය | vi | ණයගැතියන්ගේ ණය එකතු කිරීමේ කාලය |
| ii | ශුද්ධ ලාභ අනුපාතය | vii | ණය හිමියන්ට ණය ආපසු ගෙවීමේ කාලය |
| iii | ජංගම අනුපාතය | viii | ණය හිමිකම් අනුපාතය |
| iv | ක්ෂණික වත්කම් අනුපාතය | ix | කොටසක ඉපයුම(EPS) |
| v | තොග පිරිවැටුම් අනුපාතය | x | මුළු වත්කම් ඉපැයුම් ප්‍රතිලාභ අනුපාතය |

( ලකුණු 10)

II. ඔබ, සන්ෂයින් මොබයිල් ප්‍රයිවට් ලිමිටඩ් හි අලුතින් බඳවා ගත් ගණකාධිකාරීවරයා යැයි සිතන්න. ඔබගේ ප්‍රධාන කළමණාකරුට ආයතනයේ මෙම වසරේ කාර්යක්ෂමතාවය, ලාභ දායිත්වය සහ මූල්‍ය තත්ත්වය පිළිබඳව, පසු ගිය වසර දෙක හා සංසන්දනාත්මක දැන ගැනීමට අවශ්‍ය වී තිබේ.

III. 2018 , 2017 සහ 2016 යන වසර සඳහා පහත අනුපාත මේ වෙනුවෙන් ගණනය කොට ඇතැයි සිතන්න.

| අනුපාත | 2018 | 2017 | 2016 |
|---|---|---|---|
| ජංගම අනුපාතය (CA/CL) | 1:1.2 | 1:2 | 1:3 |
| ක්ෂණික වත්කම් | 1:0.25 | 1:0.5 | 1:1 |
| තොග පිරිවැටුම් වාර ගණන | 09 Times | 12 Times | 15 Times |
| ණය එකතු කිරීමේ කාලය | 100 Days | 62 Days | 45 Days |
| දළ ලාභ අනුපාතය | 31% | 33% | 42% |
| ශුද්ධ ලාභ අනුපාතය | 08% | 13.5% | 16% |
| ණය හිමිකම් අනුපතාය | 150% | 120% | 80% |

ඔබ විසින් ප්‍රධාන කළමණාකරුවෙත ලබා දීම සඳහා වාර්තාවක් පිළියෙල කරන්න.

(ලකුණ 10)

(මුළු ලකුණු 20)

ප්‍රශ්න අංක 05

පවර් ප්ලාන්ට් ලිමිටඩ් විශේෂ ටර්බයින් යන්ත්‍රයක් නිෂ්පාදනය කරයි. හයිඩ්‍රෝ පවර් සමාගමෙන් ලද විශේෂ ඇණවුමකට අදාලව නිෂ්පාදන තොරතුරු පහත දක්වා ඇත.

| කාර්යය අංකය :CC022 | ගණුදෙනු කරු : හයිඩ්‍රෝ පවර් සමාගම |
|---|---|
| ගබඩාවෙන් නිකුත් කරන ලද සෘජු ද්‍රව්‍ය | Rs.2,220,000/- |
| සැපැයුම් කරුවන්ගෙන් මිලට ගත් ද්‍රව්‍ය | Rs.800,000/- |
| සෘජු ශ්‍රම පිරිවැය - කැපුම් දෙපාර්තමේන්තුව | පැය 350 පැයක් සඳහා රු.400/- |
| සවිකිරීම් දෙපාර්තමේන්තුව | පැය 240 පැයක් සඳහා රු.450/- |
| නිමැවුම් දෙපාර්තමේන්තුව | පැය 120 පැයක් සඳහා රු.425/- |

විශේෂිත වැල්ඩින් යන්ත්‍රයක් රු.20,000 ක, දෙදෙනික කුලී පදනම මත දින 40ක් සඳහා කුලිය ලබා ගෙන තිබේ.

| කාර්යය සඳහා යන්ත්‍ර පැය වාර් | පැය |
|---|---|
| කැපුම් අංශය | 334 |
| සවිකිරීම් අංශය | 450 |
| නිමැවුම් අංශය | 300 |

නිකුත් කිරීමේ සහ නැව් ගාස්තු රු.300,000/-
සමාගමේ පොදු කාර්ය අවශෝෂණ ප්‍රතිපත්තිය පහත පරිදි වේ.
සමාගම විසින් ස්ථාපිත කොට ඇති පදනම් අනුව නිෂ්පාදන පොදුකාර්ය පිරිවැය අන්තර්ග්‍රහණය කළ යුතුය.

I. සංවර්ධන පිරිවැය , ප්‍රාථමික පිරිවැයෙන් 10% ක් වන සේ වෙන් කළ යුතුය.
II. ආයතන පරිපාලන පිරිවැය , මුළු නිෂ්පාදන පිරිවැයෙන් 15% ක් විය යුතුය..
III. සැපයුම් කරුවන්ගෙන් ලබා ගන්නා ලද සෘජු ද්‍රව්‍ය , වර්ෂය තුලදී නිෂ්පාදන කාර්යය සඳහා සම්පූර්ණයෙන් භාවිතා කොට තිබේ.

සටහන

1. නිෂ්පාදන දෙපාර්තමේන්තුවලට අදාල අයවැය ගත කොරතුරු පහත දැක්වේ.

| | යන්ත්‍ර පැය | ශ්‍රම පැය | නිෂ්පාදන පොදු කාර්යය පිරිවැය(රු.) |
|---|---|---|---|
| කැපුම් | 2,200 | 2,100 | 4,400,000 |
| සව්කිරීම් | 1,500 | 1,800 | 7,200,000 |
| නිමැවුම් | 2,000 | 1,500 | 1,000,000 |

2. ගබඩාවට ආපසු හරවා යැවූ අමුද්‍රව්‍ය රු.340,000/-
3. සෑම ගණුදෙනුකරුවකුගේ ඇණවුමක් මත , සමාගම 12% ක ලාභ ආන්තිකයක් අය කරයි.

ඔබ විසින්, හයිඩ්‍රෝ පවර් සමාගමෙන් ලද විශේෂ ඇණවුමකට අදාලව විකුණුම් මිල ගණනය කරන්න.

(ලකුණු 20)

(මුළු ලකුණු 100)

නිමි.

00402

**THE OPEN UNIVERSITY OF SRI LANKA**
**BACHELOR OF MANAGEMENT STUDIES DEGREE PROGRAMME**
**LEVEL – 3**
**FINAL EXAMINATION 2018**
**FINANCIAL AND COST ACCOUNTING -MCU 1206**
**DURATION THREE (03) HOURS**

**No of Questions 05**
**No of Pages 08**

**DATE: 03.11.2018** **TOTAL MARKS 100** **TIME: 01.30p.m. to 04.30p.m.**

**Important Instructions**

- **Answer only four (04) questions including question number one (01).**
- **Show all workings.**
- **Use of Non-programmable calculator is allowed.**

**Question No (01) (Compulsory Question)**

The Trial Balance extracted from the books of accounts of Galaxy (Pvt) Ltd. as at 31.03.2018 is given below.

(Rs.'000)

| | Dr. | Cr. |
|---|---|---|
| Stated Capital (1,000,000 Ordinary Shares) | | 35,000 |
| Retained Earnings as at 01st April 2017 | | 15,600 |
| General Reserve | | 7,500 |
| 10% Debentures | | 8,000 |
| Property plant and Equipment – at cost | | |
| Land | 43,000 | |
| Building | 20,500 | |
| Motor Vehicles | 4,500 | |
| Accumulated Depreciation as at 01st April 2017 | | |
| Building | | 3,700 |
| Motor vehicles | | 2,000 |
| Tax provision 2016/2017 | | 50 |
| Inventory as at 31st March 2018 | 6,200 | |
| Trade Receivables / Trade Payables | 5,650 | 1,880 |
| Cash at Bank | 950 | |
| Sales | | 25,000 |
| Cost of Sale | 10,700 | |
| Administration Expenses | 3,920 | |
| Distribution Expenses | 2,800 | |
| Interest on Debenture | 400 | |
| Income Tax paid | 110 | |
| Total | **98,730** | **98,730** |

**The following additional information is also provided;**

1) Property plant and equipment are to be depreciated on the straight-line basis at cost. The useful life of the assets are estimated as follows.
   - Building : 20 years
   - Motor vehicle : 5 years
2) The following accrued and prepaid expenses as at 31st March 2018 are to be accounted for:

| | Rs. |
|---|---|
| Pre-paid Rent | 25,000 |
| Accrued Electricity | 8,000 |

3) Further information on income tax are as follows:
   - Income tax liability for the year of assessment 2017/2018 is estimated to be Rs.250,000/- and is to be recorded in the books of accounts.
   - All income tax payments made during this accounting year have been debited to income tax paid account.
   - The income tax provision for the year of assessment 2016/2017 was Rs.50,000/- and it is to be adjusted for.
4) A trade receivable balance of Rs.50,000/- as at 31st March 2018 from Mr. Perera was decided to be written-off as bad debt. Provision for doubtful debts of 5% should be provided on balance trade receivable, balance at the end of the year.
5) Motor vehicle which was purchased on 01.04.2015 at Rs. 1,000,000/- had been disposed on 30.09.2017 for Rs.900,000/- .The cheque received for sale proceed had been correctly recorded in to the Bank Account but had been credited to the Retained Earnings account. No other entries had been entered on this transaction so far.
6) On 10th April 2017 , the Board of Directors has decided to pay a final dividend of Rs.5/- per ordinary share against the profit for the year ended 31st March 2017.
7) The financial statements were authorized for issue by the Board of Directors on 05th May 2017.

**You are required to :**

Prepare the following for the purpose of publications of Galaxy (Pvt) Ltd.

I. Statement of Comprehensive Income for the Year Ended 31st March 2018.

II. Statement of Financial Position as at 31st March 2018.

**(Total 40 Marks)**

**Question No (02)**

Amal, Bimal and Cyrimal were in a partnership sharing profit and loss in the ratio of 2:2:1 respectively.

The partnership agreement contains the following

- Partners are entitled to interest on capital at 10% per annum on the partner's capital account balances held at the beginning of each accounting year.
- Amal and Bimal is entitled for a salary of Rs.60,000/- and Rs.36,000/- per annum respectively.
- Capital and current account balances as at 01st April 2017 were as follows.

| | Dr. (Rs.'000) | Cr. (Rs.'000) |
|---|---|---|
| **Partners' capital accounts.** | | |
| Amal | | 4,000,000 |
| Bimal | | 2,400,000 |
| Cyrimal | | 1,800,000 |
| **Partners' current account** | | |
| Amal | | 230,000 |
| Bimal | | 160,000 |
| Cyrimal | 50,000 | |
| **Drawings during the year** | | |
| Amal | 75,000 | |
| Bimal | 43,200 | |
| Cyrimal | 90,000 | |

The following additional information is also provided.
Following adjustments are required to be made for the year ended 31.03.2018.

1) On 31st March 2018, Cyrimal decided to retire from the partnership and remaining partners agreed on the following conditions.
   - Profit and losses are to be shared equally.
   - It was agreed to continue interest on capital and Bimal's salary as per the earlier agreement without any change.
   - Goodwill is valued at Rs. 1,000,000/- and it is to be adjusted through the partners' capital account without creating a goodwill account.
   - On 31st March 2018, non-current assets were revalued and details of those are as follows.

| | Revalued Amount as at 31st March 2018 | Cost (Rs.) | Accumulated Depreciation as at 31st March 2018 |
|---|---|---|---|
| Land | 3,200,000 | 3,000,000 | - |
| Building | 4,250,000 | 4,500,000 | 1,000,000 |
| Plant | 1,000,000 | 2,500,000 | 1,250,000 |

2) Non-current assets will be carried at revalued amount in the books of account of the partnership.
3) Total amount payable to retiring partner should be kept in the partnership as a loan provided to the partnership.
4) The net profit (before appropriations) of the partnership for the year ended 31st March 2018 was Rs.2,900,000/-
5) Monthly drawings are as follows. Interest on drawings should be 12% per annum.

| | |
|---|---|
| Amal | Rs.6,250 at the beginning of every month |
| Bimal | Rs.3,600 at the middle of every month |
| Cyrimal | Rs.7,500 at the end of every month |

Using the above information, you are required to prepare following as at 31st March 2018:

I. Partners' Current Account
II. Partners' Capital Account
III. Loan Account of Cyrimal

**(Total 20 Marks)**

**Question No (03)**

The following information was extracted from the books of Senevirathne Traders, a sole proprietorship:

I. Assets and liabilities of the business are as follows. **Rs.'000**

| | As at 01st April 2017 | As at 31st March 2018 |
|---|---|---|
| Land and Building (at carrying value) | 5,000 | 4,800 |
| Motor vehicle (at carrying value) | 7,000 | 7,400 |
| Fixed Deposit at 10% | 1,000 | 1,000 |
| Inventory | 2,500 | 2,400 |
| Trade Receivable | 2,800 | 2,700 |
| Cash at Bank | 1,300 | ? |
| Trade Payables | 1,600 | 1,350 |
| Accrued Electricity | 220 | 170 |

II. Mr. Senevirathne does not keep proper books of account for the business. He has analyzed the bank statements of the business from 01st April 2017 to 31st March 2018 and summarized the transactions as follows:

| | Rs.'000 | | Rs.'000 |
|---|---|---|---|
| Deposits: | | Payments made by cheques: | |
| Out of cash sales | 3,500 | Directors Remuneration | 280 |
| Receipts from trade receivables | 2,500 | Salaries | 760 |
| Receipt of a loan | 1,000 | Electricity | 220 |

| | | | |
|---|---|---|---|
| Payments made by cheques: | | Water | 272 |
| Cash purchases | 1,250 | Insurance | 150 |
| Payments to trade payables | 1,500 | Bad debts | 28 |
| Purchase of a motor vehicle on 31st March 2018 | 1,000 | Advertising | 300 |

III. Senevirathne had deposited all cash receipts in to bank account except taking Rs.25,000/- per month as drawings out of cash sales.

IV. Senevirathne obtained a bank loan of Rs.1,000,000/- on 01st July 2017 at an interest rate of 15% per annum, in which the interest is to be paid monthly. However, no interest has been paid during the year ended 31st March 2018. Repayment of loan will be started from 01st April 2018.

V. Provision for bad debt should be 10% of debtors balance as at 31.03.2018

You are required to :

a. Prepare the Trial Balance of Senevirathne Traders as at 31st March 2018

**(10 Marks)**

b. The Statement of Financial Position as at 31st March 2018 for the same entity.

**(10 Marks)**

**(Total 20 Marks)**

**Question No (04)**

I. Following are the Income Statement for the year ended 31st March 2018 and Statements of Financial Position as at 31.03.2017 and 31.03.2018 of Sunshine Mobile Ltd.

**Income Statement** **(Rs.000)**

| | **2017/2018** | |
|---|---|---|
| Sales | | 217,500 |
| Cost of Sales | | (165,000) |
| Gross profit | | 52,500 |
| Other Income | | 3,000 |
| | | 55,500 |
| Distribution Expenses | 6,375 | |
| Administrative Expenses | 21,000 | |
| Other Expenses | 3,225 | |
| Financial Expenses | 1,000 | (31,600) |
| Profit before Tax | | 23,900 |
| Tax | | (8,900) |
| Net Profit after Tax (Profit for the Period) | | 15,000 |

**Statement of Financial Position** **(Rs.'000)**

| | 31.03.2018 | | 31.03.2017 | |
|---|---|---|---|---|
| **Assets** | | | | |
| **Non Current Assets** | | | | |
| Property Plant & Equipment | | 134,700 | | 135,000 |
| | | | | |
| **Current Assets** | | | | |
| Inventory | 8,700 | | 9,300 | |
| Trade Receivables | 13,350 | | 15,750 | |
| Other Current Assets | 2,700 | | 4,500 | |
| Cash and Cash Equivalents | 1,950 | 26,700 | 4,200 | 33,750 |
| **Total Assets** | | **161,400** | | **168,750** |
| **Equity & Liabilities** | | | | |
| **Equity** | | | | |
| Capital & Reserves | | | | |
| Stated Capital issued at Rs.10/- each | | 94,800 | | 92,100 |
| Reserves | 9,000 | | 7,000 | |
| Retained Profit | 35,950 | 44,950 | 24,400 | 31,400 |
| Total Equity | | 139,750 | | 123,500 |
| **Liabilities** | | | | |
| **Non Current Liabilities** | | | | |
| 15% Bank Loan - Peoples Bank | | 9,500 | | 22,000 |
| **Current Liabilities** | | | | |
| Trade Payables | 9,375 | | 18,445 | |
| Tax Payables | 2,775 | 12,150 | 4,805 | 23,250 |
| | | | | |
| Total Equity and Liabilities | | **161,400** | | **168,750** |

**Following additional information is also available**

a. 80% of total sales and 15% of total purchases were on credit basis
b. Current assets as at 01.04.2017
   - Inventory Rs.8,700,000
   - Trade Receivables Rs.12,100,000
c. Current Liabilities as at 01.04.2017
   - Trade Payables Rs.8,555,000

You are required to calculate the following ratios for the financial year 2017/2018

i Gross Profit Ratio
ii Net Profit Ratio
iii Quick Assets Ratio
iv Current Ratio
v Inventory Turnover Times
vi Average Debtor collection period
vii Average Period of Accounts Payable
viii Debt Equity Ratio
ix Earnings per Share (EPS)
x Return on Total Assets

**(10 Marks)**

II. Suppose you are the newly recruited Accountant of Sunshine Mobile (Pvt) Ltd. The Managing Director of the company wants to get an idea of efficiency, profitability and financial strength of the company of the current year compared to previous two years.

The following ratios have been calculated for the years ended 31st March 2018, 2017 and 2016 for this purpose.

| **Ratios** | **2018** | **2017** | **2016** |
|---|---|---|---|
| Current Ratio (CA/CL) | 1:1.2 | 1:2 | 1:3 |
| Quick Assets Ratio | 1:0.25 | 1:0.5 | 1:1 |
| Inventory Turnover times | 09 Times | 12 Times | 15 Times |
| Debt collection Period | 100 Days | 62 Days | 45 Days |
| Gross Profit Ratio | 31% | 33% | 42% |
| Net Profit Ratio | 08% | 13.5% | 16% |
| Debt Equity Ratio | 150% | 120% | 80% |

You are required to prepare a report to the Managing Director of the company.

**(10 Marks)**

**(Total 20 Marks)**

**Question No (05)**

Power plant Ltd is the manufacturer of special turbine. Following information have been extracted from the special order received from Hydro Power Company for the production of a water turbine.

| Job No :CC022 | Customer : Hydro Power Company |
|---|---|
| Direct material issued from the Stores | Rs.2,220,000/- |
| Direct material purchased from suppliers | Rs.800,000/- |
| Direct Labour Cost- Departments Cutting | 350 hours, Rs.400/- per hour |
| Departments Fixing | 240 hours, Rs.450/- per hour |
| Departments Finishing | 120 hours, Rs.425/- per hour |

A special welding machine has been taken on rent paying Rs.20,000 per day for fourty (40) days.

| Machine hours recorded for the Job | Hours |
|---|---|
| Cutting | 334 |
| Fixing | 450 |
| Finishing | 300 |

Dispatch and shipping charge is Rs.300,000/-

**Overhead absorption policy of the company**

Non-production cost should be absorbed according to the overhead absorption rates stipulated by the company as given below.

I. Development cost should be allocated as 10% of primary cost.
II. General administration cost should be allocated as 15% of total production cost.
III. Direct material purchased from suppliers has been fully utilized to the production during the year.

**Notes**

1. Budgeted Information related to production department is as follows.

| | Machine hours | Labour hours | Production Over Head (Rs.) |
|---|---|---|---|
| Cutting | 2,200 | 2,100 | 4,400,000 |
| Fixing | 1,500 | 1,800 | 7,200,000 |
| Finishing | 2,000 | 1,500 | 1,000,000 |

2. Direct material return to stores Rs.340,000/-
3. The company set 12% profit margin on each customer order.

You are required to calculate selling price charge from Hydro Power Company for the production of special turbine.

**(Total 20 Marks)**

**(Aggregate 100 Marks)**

**END**